**II කලාපය-අප්‍රේල්-ජූනි**

# ගාලු උරුමය
# GALLE HERITAGE

**ලෝක උරුමයක අභිමානය සුරකින නිල පුවත් සංග්‍රහය**

GALLE HERITAGE FOUNDATION




- “ගාලු කොටුවට ආදරයෙන්”....
- අලුත් ගමනක යෙදෙන ගාලු උරුමය පදනම....
- ඉතිහාසයේ පා සටහන් මතින් “ගාලු වංශය” ලියැවෙන වගයි.....
- යුධ කාමරයකින් උපන් “සඳු ගැලරිය”....
- සංචාරක යටිතල පහසුකම් නංවන්නට “ගාලු උරුමය” කැපවෙයි.....

# ‘ගාලු උරුමය පුවත් සංග්‍රහය’




## කර්තෘ මණ්ඩලය

### උපදේශකත්වය

- මහාචාර්ය දේව මයිකල් ද සිල්වා මයා
- අසංග උදුල ධර්මදාස මයා

### ප්‍රධාන සංස්කාරක

- ඩබ්. ඒ. අයේෂා මිය

### සංස්කාරක මණ්ඩලය

- පී.ජී.එන්. චන්දිමාලි මිය
- බී.එස්. ඉලේපෙරුම මිය

### ඡායාරූපකරණය, වෙබ් සහ සමාජ මාධ්‍ය

- ඉෂානි ප්‍රියදර්ශනී මිය

### විශේෂාංග ලේඛකයන්

- රිද්මි නානායක්කාර මිය
- රොෂාන් රණසිංහ මයා
- අනූෂි චාන්දිමා මෙය
- චම්පා කුමුදුනී මෙනවිය
- ඩිලානි හර්ෂිකා මෙය
- ශිරංග ජයසේකර මයා


## සම්බන්ධීකරණ විස්තරය

**ලිපිනය**
නො.12,රැම්පාට් වීදිය,
කොටුව,ගාල්ල.
**දුරකතනය**
0912246784
**විද්‍යුත් ලිපිනය**
herifo@sltnet.lk


Antique map of Galle fort, Ceylon. 1726



# පටුන | CONTENTS

01 — ගාලු කොටුවට ආදරයෙන්: ලෝක පරිසර දිනයේ දැවැන්ත පිරිසිදු කිරීමේ ශ්‍රමදාන මෙහෙයුම

02 — දත්ත මත පදනම් වූ විද්‍යාත්මක පරිසර කළමනාකරණයක්

03 — අලුත් ගමනක යෙදෙන ගාලු උරුමය පදනම:

05 — ඉතිහාසයේ පා සටහන් මතින් 'ගාලු වංශය' ලියැවෙන වගයි

07 — ගාලු කොටුවේ උරුමය ලොවට ගෙනයන්නට උරුම අර්ථකතනය ශක්තිමත් කරමින්

08 — ලෝක උරුම ගාලු කොටුවේ සංචාරක යටිතල පහසුකම් නංවන්නට 'ගාලු උරුමය පදනමෙන්' කාලීන පියවරක්

09 —නවීන සනීපාරක්ෂක පද්ධතිය සහ සෝලා CCTV කැමරා

10 — නව ආයෝජන අවස්ථා

11 — යුධ කාමරයකින් උපන් 'සඳු ගැලරිය': දශකයක සංරක්ෂණ අභිමන්තය

13 — ගාලු කොටුවේ හෙට දවස උදෙසා පෙළගැසුණු බහුවිධ ගවේෂණාත්මක සමීක්ෂණය

15— ලෝක උරුමයක පියසටහන් මතින්: ගාලු කොටුවේ ජංගම වෙළඳාමට නව මුහුණුවරක්

# කතුවැකිය | EDITORIAL

## උරුමයක අභිමානය සහ මතු පරපුරේ වගකීම

ලෝක උරුමයක් යනු හුදෙක් අතීතයෙන් අපට ලැබුණු දායාදයක් පමණක් නොවේ. එය අප විසින් මතු පරපුර වෙනුවෙන් සුරක්ෂිතව භාර දිය යුතු ජීවමාන ඉතිහාසයකි. දකුණු ලක අභිමානය වූ ඓතිහාසික ගාලු කොටු පියස, සියවස් ගණනාවක සංස්කෘතික, දේශපාලනික සහ සමාජයීය විපර්යාසයන්ට නිහඬව සාක්ෂි දරමින් අදටත් විරාජමානව පවතී. එවන් අමිල ලෝක උරුමයක් වාණිජකරණයේ සහ නූතන සමාජයේ අවිධිමත් මිනිස් ක්‍රියාකාරකම් හමුවේ විනාශ වන්නට නොදී, එහි "කැපී පෙනෙන විශ්වීය වටිනාකම" (Outstanding Universal Value) ආරක්ෂා කරගැනීම අප සැමගේ සාමූහික වගකීමකි.

ගාලු උරුමය පදනම (Galle Heritage Foundation) වර්තමානය වන විට එම වගකීම හුදෙක් සංරක්ෂණයකට පමණක් සීමා නොකර, කාලීන සහ තිරසර සංවර්ධන ප්‍රවේශයන් ඔස්සේ ඉදිරියට රැගෙන යමින් සිටී. රාජ්‍ය ආයතනයක් ලෙස "ස්වයං මූල්‍යකරණ" (Self-financing) උපායමාර්ගික මාවතකට අවතීර්ණ වෙමින්, තමන් සතු සම්පත්වලින් උපරිම ඵල නෙළාගන්නා අතරම, එම ප්‍රතිපූර්ණයන් නැවතත් උරුමයේ පැවැත්ම වෙනුවෙන්ම ආයෝජනය කිරීම අතිශයින්ම අගය කළ යුතු ආදර්ශවත් පියවරකි.

"ගාලු කොටුවට ආදරයෙන්" තේමාව කරගනිමින් ක්‍රියාත්මක වූ දැවැන්ත පාරිසරික ශ්‍රමදාන, දෛනික ප්ලාස්ටික් කළමනාකරණ ව්‍යාපෘති, සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රගමනය උදෙසා කෙරෙන යටිතල පහසුකම් නැංවීම් සහ ජංගම වෙළඳාම විධිමත් කරමින් ඔවුන්ගේ වෘත්තීය ගෞරවය රැකදීමට ගන්නා උත්සාහයන් තුළින් පෙනී යන්නේ භෞතික සංවර්ධනය මෙන්ම මානව සම්පතෙහි ගුණාත්මකභාවය ද පදනම විසින් මැනවින් හඳුනාගෙන ඇති බවයි.

එලෙසම, රුහුණ විශ්වවිද්‍යාලයීය විද්වතුන් සහ තරුණ ශිෂ්‍ය ප්‍රජාව ඒකාබද්ධ කරගනිමින් සිදුකෙරෙන බහුවිධ ගවේෂණාත්මක සමීක්ෂණ මෙන්ම ගාල්ලේ සමස්ත අභිමානය අකුරු කෙරෙන 'ගාලු වංශය' මහා ශාස්ත්‍රීය සම්පාදනය, අපගේ ඓතිහාසික උරුමයට බුද්ධිමය වටිනාකමක් එක් කරයි.

මෙම සඟරාව දිගහැරෙන්නේ, ගාලු කොටුවේ ඓතිහාසික අනන්‍යතාවය සුරකිමින්, එය නූතන ලෝකයට ගැළපෙන සේ තිරසර ලෙස කළමනාකරණය කිරීමට ගාලු උරුමය පදනම රාජ්‍ය, පෞද්ගලික සහ විශ්වවිද්‍යාලයීය සහයෝගීතාවයෙන් යුතුව තැබූ සාර්ථක පියවරයන්හි සජීවී සාක්ෂියයි. අපගේ ප්‍රාර්ථනය සහ අධිෂ්ඨානය විය යුත්තේ, මේ මහා සාමූහික ප්‍රයත්නයට ශක්තියක් වෙමින් අපේ අතීත උරුමය හෙට දවසේ ද දෑස් මෙන් රැකගැනීමයි.

**කර්තෘ මණ්ඩලය**
*ගාලු උරුමය පදනම*

# "ගාලු කොටුවට ආදරයෙන්"

## උරුමයක අභිමානය සහ මතු පරපුරේ වගකීම

**ලෝක පරිසර දිනය නිමිත්තෙන් ගාලු කොටුවේ දැවැන්ත පිරිසිදු කිරීමේ ශ්‍රමදාන මෙහෙයුමක්... ප්ලාස්ටික් අපද්‍රව්‍ය කිලෝ 300ක් ඇතුළුව ගාලු කොටුවෙන් බැහැර කරන ලද අපද්‍රව්‍ය වල මුලු බර ටොන් 1කට අධික යි.**

ජගත් පරිසර දිනයට සමගාමීව, යුනෙස්කෝ ලෝක උරුමයක් වන ඓතිහාසික ගාලු කොටු පියසෙහි පාරිසරික සුන්දරත්වය සුරක්ෂිත කිරීම සහ එහි අමිල උරුම වටිනාකම් අනාගත පරපුර වෙත සුරක්ෂිතව දායාද කිරීමේ අරමුණ පෙරදැරි කරගෙන **"ගාලු කොටුවට ආදරයෙන්" (Love for Galle Fort)** යන උදාර තේමාව යටතේ පිරිසිදු කිරීමේ ශ්‍රමදාන වැඩසටහනක් 2026 ජුනි මස 05 වන දින අතිසාර්ථක අයුරින් පවත්වන ලදී.

ගාලු උරුමය පදනම (Galle Heritage Foundation) විසින් සංවිධානය කරනු ලැබූ මෙම වැඩසටහන, පරිසර සංරක්ෂණය සහ උරුම කළමනාකරණය (Heritage Management) සම්බන්ධයෙන් රාජ්‍ය, පෞද්ගලික සහ සිවිල් ප්‍රජා සහභාගීත්වය මනාව ඒකාබද්ධ කළ අතිශය සාර්ථක හා ආදර්ශවත් ව්‍යාපෘතියක් බවට පත් විය.

## සාමූහික ප්‍රයත්නයක සමාරම්භය

මෙම සත්කාර්යයේ සමාරම්භක අවස්ථාව සඳහා කොටුව සුධර්මාලය විහාරස්ථානයේ විහාරාධිපති අතිපූජ්‍ය පනංගල හේමාලෝක නායක ස්වාමීන් වහන්සේ, දකුණු පළාත් ආණ්ඩුකාර මහාචාර්ය සුසිරිපාල මානවඩු මහතා, වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍ය නලින් හේවගේ මහතා සහ ගාලු උරුමය පදනමේ සභාපති මහාචාර්ය දේව මයිකල් ද සිල්වා මහතා ඇතුළු සම්භාවනීය ආරාධිත පිරිසක් සහභාගී වූහ. වැඩසටහන සඳහා විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් 150 කට අධික ස්වේච්ඡා සේවකයින් පිරිසක් ඉතා උද්‍යෝගයෙන් යුතුව ශ්‍රම දායකත්වය සැපයූහ.







# හරිත ගාලු කොටුවක් තිරසර වැඩපිළිවෙළක්

## ❖ දත්ත මත පදනම් වූ විද්‍යාත්මක පරිසර කළමනාකරණයක්

මෙම වැඩසටහනේ පැසසිය යුතු විශේෂත්වය වූයේ රැස් කරන ලද අපද්‍රව්‍ය හුදෙක් බැහැර කිරීම පමණක් නොව, විද්‍යාත්මක පරිසර කළමනාකරණ ක්‍රමවේදයකට අනුව ඒවා විධිමත්ව වර්ගීකරණය කර බර මැන බැලීමයි. ඒ අනුව එකතු කරන ලද සමස්ත ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය **කිලෝග්‍රෑම්** 1,095 **ක් (ටොන්** 1.09 **ක්)** ලෙස වාර්තා විය. මෙම අපද්‍රව්‍ය අතරින් ප්ලාස්ටික් ජල බෝතල්, පී.වී.සී බට, වීදුරු, කඩදාසි, බියර් ටින් සහ ලෝහ ද්‍රව්‍ය එදිනම ප්‍රතිචක්‍රීකරණය කරන ආයතන වෙත ක්‍රමවත්ව ප්‍රවාහනය කර යොමු කරන ලදී. මෙම ප්‍රමාණාත්මක දත්ත මඟින් ගාලු කොටුව තුළ පවතින පාරිසරික අභියෝගයන් හඳුනාගැනීමටත්, අනාගත තිරසාර සැලසුම් ක්‍රියාවට නැංවීමටත් මනා දත්ත පදනමක් (Database) සැපයේ.

**"ගාලු කොටුවට ආදරයෙන්"** ශ්‍රමදාන වැඩසටහන හුදෙක් එක්දින පිරිසිදු කිරීමේ ව්‍යාපෘතියක් පමණක් නොවේ. එය ලෝක උරුම ගාලු කොටුව තුළ තිරසාර පරිසර කළමනාකරණයක් ස්ථාපිත කිරීමේ පුළුල් සැලැස්මක සජීවී කොටසකි.

ඒ අනුව, ගාලු උරුමය පදනමේ සක්‍රීය මැදිහත් වීමෙන් සහ **Global Communities** ආයතනයේ දායකත්වයෙන් 2026 **අප්‍රේල් මස** 30 **වන දින සිට** ගාලු කොටුව තුළ දෛනිකව එක්රැස් වන ප්ලාස්ටික් අපද්‍රව්‍ය විධිමත්ව කළමනාකරණය කිරීමේ දෛනික වැඩසටහනක් මේ වන විට සාර්ථකව ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘතිය යටතේ, කොටු පවුර සහ ඒ අවට පරිශ්‍රයෙන් දෛනිකව එකතු වන සියලුම ප්ලාස්ටික් අපද්‍රව්‍ය වර්ගීකරණය කර පරිසර හිතකාමී ලෙස ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කෙරේ.



**පිරිසිදු පරිසරයක් සහ සුරක්ෂිත උරුමයක් යනු හෙට දවසේ අපගේ මතු පරපුර වෙනුවෙන් අපට දායාද කළ හැකි වටිනාම ඓතිහාසික තිළිණයයි. ඒ වෙනුවෙන් එක්ව ක්‍රියා කළ සියලුම රාජ්‍ය, පෞද්ගලික සහ ස්වේච්ඡා සංවිධාන වෙත ගාලු උරුමය පදනමේ හෘදයාංගම උපහාරය හිමි වේ.**



**ගාලු කොටුව තුල එක්රැස් වන ප්ලාස්ටික් බෝතල් සහ බියර් ටින් ගාලු උරුමයට භාර දෙන්න.**

**විමසීම්-0912246784**

# අලුත් ගමනක යෙදෙන ගාලු උරුමය පදනම....

ගාලු උරුමය පදනම (Galle Heritage Foundation) 2026 වර්ෂයේ සිට ස්වයං මූල්‍ය ආයතනයක් (Self-financing Institution) ලෙස ස්වාධීනව ක්‍රියාත්මක වීමට නියමිතව ඇත. මෙම පරිපාලනමය වෙනස වඩාත් ශක්තිමත් කරමින් සහ පවතින සම්පත් උපරිම ඵලදායීතාවයකින් යුතුව භාවිතයට ගැනීමේ අරමුණින්, ගාලු උරුම තොරතුරු මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ අලුතින් ස්ථාපිත කරන ලද **GHF Mini Conference Hall** පහසුකම 2026 **අප්‍රේල් මස සිට** මහජන හා ආයතනික භාවිතය සඳහා විවෘත කර ඇත.

මෙමඟින් රාජ්‍ය ආයතන, දෙපාර්තමේන්තු, පෞද්ගලික ව්‍යවසායකයින්, වෘත්තීය සංවිධාන සහ අනෙකුත් පාර්ශවයන් සඳහා රැස්වීම්, සාකච්ඡා, පුහුණු වැඩමුළු, ප්‍රගති සමාලෝචන වැඩසටහන් සහ කුඩා පරිමාණ සම්මන්ත්‍රණ උසස් ප්‍රමිතියෙන් යුතුව පැවැත්වීමේ අවස්ථාව සැලසී තිබේ.

**GHF**
**Mini Conference Hall**
**ගාලු උරුමය පදනමේ**
**ස්වයං මූල්‍යකරණ උපායමාර්ගික**
**ප්‍රවේශය**

## ප්‍රථම නිල සමාරම්භය — "ලස්සන ගාලු පුරේ"

මෙම ශාලාවේ ප්‍රථම නිල වැඩසටහන ලෙස 2026 මැයි මස 05 වන දින ජනප්‍රිය ගායන ශිල්පී ප්‍රේමසිරි දික්වැල්ල මහතාගේ **"ලස්සන ගාලු පුරේ"** සංගීත වීඩියෝව (Music Video) එළිදැක්වීමේ උත්සවය අතිසාර්ථක අයුරින් පවත්වන ලදී.

ගාලු නගරයේ සංස්කෘතික අනන්‍යතාවය, වාස්තුවිද්‍යාත්මක වටිනාකම සහ ඓතිහාසික සුන්දරත්වය අගයමින් නිර්මාණය කරන ලද මෙම සංගීත නිර්මාණය එළිදැක්වීමේ උත්සවය, GHF Mini Conference Hall හි පවතින උසස් තාක්ෂණික සහ සන්නිවේදන පහසුකම් මැනවින් ප්‍රදර්ශනය කළ කදිම අවස්ථාවක් විය.




- ✓ **රාජ්‍ය ආයතන සඳහා සුවිශේෂී 50% සහනයක්.**
- ✓ **එකවර සාමාජිකයින් 60 දෙනෙකුට සුවපහසු ලෙස අසුන්ගත හැකි වීම.**
- ✓ **අතිනවීන ස්මාර්ට් බෝඩ් (Smart Board) සහ ප්‍රක්ෂේපණ පහසුකම්.**
- ✓ **උසස් ශබ්ද වාහිනී පද්ධති (Sound Systems).**
- ✓ **වෘත්තීය මට්ටමේ පෝඩියම් සහ විශේෂ ආරාධිත අසුන්.**

## උරුමය සහ තිරසාර සංවර්ධනයේ සහසම්බන්ධතාවය

**GHF Mini Conference Hall** පහසුකම හරහා උපයා ගන්නා සියලුම ආදායම් සෘජුවම යොදවනු ලබන්නේ ගාලු කොටුවේ උරුම සංරක්ෂණ ව්‍යාපෘති, පාරිසරික කළමනාකරණය, ප්‍රජා සවිබල ගැන්වීම් සහ සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන් සඳහාය.

මෙය ගාලු උරුමය පදනමේ සම්පත් කළමනාකරණය පිළිබඳ නව ප්‍රවේශයක් පමණක් නොව, රාජ්‍ය ආයතනයක් ස්වයංපෝෂිත මූල්‍ය ආකෘතියක් (Self-sustaining Business Model) කරා ගමන් කිරීමේ සාර්ථක ආදර්ශයකි.



# ඉතිහාසයේ පා සටහන් මතින්...............
# ගාලු වංශය ලියැවෙන වගයි.....

ශ්‍රී ලාංකීය ඉතිහාසය හා සංස්කෘතිය පෝෂණය කිරීමෙහිලා ප්‍රමුඛතම මෙහෙවරක් ඉටුකළ ඓතිහාසික ගාල්ල දිස්ත්‍රික්කයේ අභිමානය මතු පරපුර උදෙසා දායාද කිරීමේ අරමුණින් සම්පාදනය වන **'ගාලු වංශය'** ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ නවතම ප්‍රගති සමාලෝචන රැස්වීමක් පසුගියදා සාර්ථකව පවත්වන ලදී.




## රාජ්‍ය සහ විද්වත් ප්‍රභූන්ගේ මූලිකත්වය

**2026 අප්‍රේල් මස 10 වන දින** දකුණු පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේදී මෙම විශේෂ සාකච්ඡාව සංවිධානය කර තිබුණි. ඒ, දකුණු පළාත් ආණ්ඩුකාරවර, රුහුණු විශ්වවිද්‍යාලයේ හිටපු මහාචාර්ය **සුසිරිපාල මානවඩු මැතිතුමාගේ** ප්‍රධානත්වයෙනි.

මෙම අවස්ථාව සඳහා රාජ්‍ය නිලධාරීන් සහ විද්වතුන් රැසක් සහභාගී වූ අතර, ඒ අතර

- දකුණු පළාත් ප්‍රධාන ලේකම්, **චන්දිම සී. මුහන්දිරම් මහතා**
- ගාල්ල දිස්ත්‍රික් ලේකම්, **කේ.යූ. චන්ද්‍රලාල් මහතා**
- දකුණු පළාත් ආණ්ඩුකාරතුමාගේ පෞද්ගලික ලේකම්, **සුධර්මන් වෛද්‍යරත්න මහතා**
- දකුණු පළාත් ක්‍රීඩා හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්, **ඉන්දික සම්පත් සමරකෝන් මහතා**
- දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ සහකාර ලේකම්, **එච්.ඩී.ඩී.එස්.ඩබ්. හේරත් මහතා**
- ගාලු උරුමය පදනමේ සභාපති, **මහාචාර්ය දේව මයිකල් ද සිල්වා මහතා** ඇතුළු එම පදනමේ කාර්ය මණ්ඩල නිලධාරී මහත්ම මහත්මීන් ද විය.

## පූර්ණ මූල්‍ය දායකත්වය සහ ප්‍රතිපාදන



'ගාලු වංශය' ග්‍රන්ථය සාර්ථකව නිම කිරීම සඳහා අපේක්ෂිත ඇස්තමේන්තුගත සමස්ත මූල්‍ය ප්‍රතිපාදනය **දකුණු පළාත් ක්‍රීඩා හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය** මඟින් ලබාදිය හැකි බව එම අමාත්‍යාංශයේ ලේකම් ඉන්දික සම්පත් සමරකෝන් මහතා මෙහිදී නිල වශයෙන් ප්‍රකාශ කර සිටියේය.

## පර්යේෂණ හා ලිපි එකතු කිරීමේ මූලික පියවර

ග්‍රන්ථයේ ශාස්ත්‍රීය වටිනාකම උපරිම මට්ටමකින් පවත්වා ගැනීම සඳහා මේ වන විටත් මූලික වැඩකටයුතු ආරම්භ කර ඇත. ඒ අනුව:

**විශ්වවිද්‍යාලයීය දායකත්වය:** ‘ගාලු වංශය’ ග්‍රන්ථයට ඇතුළත් කිරීමට සුදුසු, උසස් මට්ටමේ ශාස්ත්‍රීය ලිපි ලබාගැනීම වෙනුවෙන් ක්ෂේත්‍රයේ ප්‍රවීණ විද්වතුන් සහ පර්යේෂකයන් හඳුනාගෙන, ඔවුන් සේවය කරන අදාළ විශ්වවිද්‍යාල වෙත මේ වන විටත් නිල ලිපි යොමු කර ඇත.

**බාහිර විද්වතුන් සම්බන්ධ කරගැනීම:** විශ්වවිද්‍යාල පද්ධතියට අමතරව, ගාල්ලේ ඉතිහාසය හා උරුමය පිළිබඳව පර්යේෂණ සිදුකරන බාහිර විද්වතුන් හා ස්වාධීන පර්යේෂකයන් ද වෙන් වෙන් වශයෙන් හඳුනාගනිමින් ඔවුන්ගේ දායකත්වය ද මේ සඳහා ලබාගැනීමට අවශ්‍ය කටයුතු මේ දිනවල ඉතා සාර්ථකව සිදුකෙරෙමින් පවතී.



**දකුණු ලක ඓතිහාසික අනන්‍යතාවය ලොවටම කියාපාන අම්ල ශාස්ත්‍රීය නිබන්ධනයක් ලෙසින් ‘ගාලු වංශය’ ග්‍රන්ථය, නුදුරේදීම පාඨක ප්‍රජාව අතට පත්වෙනු ඇත.**





# ගාලු කොටුවේ උරුමය ලොවට ගෙනයන්නට උරුම අර්ථකතනය ශක්තිමත් කරමින්..........

ලෝක උරුම ගාලු කොටුවේ සැබෑ ඓතිහාසික හා සංස්කෘතික වටිනාකම දෙස් විදෙස් සංචාරකයින් වෙත නිවැරදිව සන්නිවේදනය කිරීමේ අරමුණින්, සංචාරක මඟපෙන්වන්නන් (Tour Guides) උදෙසා සංවිධානය කරන ලද **"උරුම අර්ථකථන වැඩසටහන"** පසුගියදා සාර්ථකව නිමාවට පත්විය.

**2026 මැයි මස 13 සහ 14** යන දෙදින පුරා මෙම සුවිශේෂී පුහුණු වැඩසටහන පවත්වන ලද්දේ ගාල්ල කොටුව, බාලදක්ෂ මාවතේ පිහිටි **ගාලු උරුම තොරතුරු මධ්‍යස්ථානයේදීය.**

## අරමුණ සහ සහභාගිත්වය

ගාලු කොටුව නැරඹීමට පැමිණෙන සංචාරකයින්ට එහි ඇති ඓතිහාසික වැදගත්කම සහ පෞරාණික උරුමයන් පිළිබඳව නිසි අවබෝධයක් ලබාදීමට නම්, ක්ෂේත්‍රයේ නියුතු මාර්ගෝපදේශකයින් සතුව ඇති දැනුම නිරන්තරයෙන් යාවත්කාලීන විය යුතුය. මෙම අඩුව පුරවමින් පැවැත්වුණු මෙම වැඩසටහන සඳහා සංචාරක මඟපෙන්වන්නන් **25 දෙනෙකු** සහභාගී වූහ.



## න්‍යායාත්මක දැනුම සමඟ ප්‍රායෝගික ක්ෂේත්‍ර පුහුණුව





වැඩසටහනේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ක්ෂේත්‍රයේ ප්‍රවීන දේශකයන් සහ පර්යේෂකයන් රැසක් සම්පත්දායකයින් ලෙස තම දායකත්වය සපයන ලද අතර මෙම පුහුණු වැඩසටහන හුදෙක් දේශන කාමරයකට පමණක් සීමා නොවූ සහභාගී වූවන්ට ගාලු කොටුවේ ඉතිහාසය, එහි ආරක්ෂක උපක්‍රම සහ මුහුදු පත්ලේ සැඟවුණු සමුද්‍රීය ඉතිහාසය පිළිබඳව සුවිශේෂී **ක්ෂේත්‍ර චාරිකාවක් (Field Tour)** ද සංවිධානය කර තිබුණි.

මෙම ප්‍රායෝගික පුහුණුව හරහා කොටු පවුරේ සැඟවුණු ඉතිහාසය සියැසින් දැකබලා ගනිමින්, සංචාරකයෙකුට උරුමයන් පිළිබඳව රසවත්ව අර්ථකථනය කරන්නේ කෙසේද යන්න පිළිබඳව මඟපෙන්වන්නන්ට ඉතා හොඳ ප්‍රායෝගික අත්දැකීමක් ලබා ගැනීමට හැකි විය.

# ලෝක උරුම ගාලු කොටුවේ සංචාරක යටිතල පහසුකම් නංවන්නට 'ගාලු උරුමය පදනමෙන්' කාලීන පියවරක්.........

ශ්‍රී ලංකාවේ දකුණු ලක අභිමානය ලොවටම කියාපාන ලෝක උරුම ගාලු කොටුව යනු වර්තමානය වන විට දෙස් විදෙස් සංචාරක ආකර්ෂණය ඉහළින්ම දිනාගත් සුවිශේෂී සංචාරක ගමනාන්තයකි. දිනපතා දහස් සංඛ්‍යාත සංචාරකයින් පිරිසක් මෙහි සිරි නැරඹීමට පැමිණිය ද, ඔවුන් මුහුණ දෙන ප්‍රධානතම ගැටලුවක් වූයේ කොටු පවුර පරිශ්‍රය තුළ ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැති වීමයි.

සංචාරකයින් දිගු කලක් තිස්සේ මුහුණ දුන් මෙම පොදු අපහසුතාවයට ස්ථිරසාර විසඳුමක් ලබාදීමට **ගාලු උරුමය පදනම** වර්තමානයේදී පෙරමුණ ගෙන ඇත.

## ව්‍යාපෘතියේ ආරම්භය සහ වත්මන් ප්‍රගතිය

ගාලු කොටුවට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්ගේ සනීපාරක්ෂක අවශ්‍යතා උසස් මට්ටමකින් සපුරාලීම වෙනුවෙන් සියලු පහසුකම්වලින් සමන්විත නවීන වැසිකිළි පද්ධතියක් ඉදිකිරීමේ කටයුතු **2025 වසරේ නොවැම්බර් මාසයේදී** ආරම්භ කරන ලදී.



වර්තමානය වන විට මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ඉතා සාර්ථකව ඉදිරියට ඇදෙන අතර, එහි සමස්ත වැඩකටයුතුවලින් **සියයට අනූවක්ම (90%) මේ වන විට අවසන් කර තිබීම** සුවිශේෂී තත්ත්වයකි.

## කඩිනමින් සංචාරක අයිතියට

ඉදිකිරීම් අවසන් අදියරට පැමිණ ඇති මෙම නවීන සනීපාරක්ෂක පද්ධතිය ඉතාමත් කෙටි කලක් ඇතුළත සංචාරක ජනතාවගේ පරිහරණය සඳහා විවෘත කිරීමට ගාලු උරුමය පදනමේ වත්මන් නායකත්වය සහ නිලධාරී මණ්ඩලය දැඩි කැපවීමකින් යුතුව කටයුතු කරමින් සිටී.

## ගුණාත්මක සංචාරක සේවාවක් දෙසට



මෙම ව්‍යාපෘතිය නිමාවීමත් සමඟ, ගාලු කොටුව නැරඹීමට පැමිණෙන විදේශීය මෙන්ම දේශීය සංචාරකයින්ට ද වඩාත් සුවපහසු වටපිටාවක් නිර්මාණය වනු ඇත. එමෙන්ම, ගෝලීය සංචාරක සිතියමේ ඉහළම ස්ථානයක වැජඹෙන ගාලු කොටු පරිශ්‍රයේ යටිතල පහසුකම් ජාත්‍යන්තර ප්‍රශස්ත මට්ටමකට ඔසවා තැබීමට ද මෙමගින් මනා පිටුවහලක් ලැබෙනු නොඅනුමානය.

# උරුමය සුරකින්නට 'ගාලු උරුමය පදනමෙන්' සෝලා CCTV කැමරා!

ශ්‍රී ලංකාවේ ප්‍රධානතම සංචාරක කේන්ද්‍රස්ථානයක් වන ලෝක උරුම ගාලු කොටු පරිශ්‍රය, දෙස් විදෙස් සංචාරකයින්ට වඩාත් ආකර්ෂණීය, සුපිරිසිදු මෙන්ම ආරක්ෂිත ස්ථානයක් බවට පත්කිරීම වෙනුවෙන් **ගාලු උරුමය පදනම** නිරන්තරයෙන්ම කැපවී ක්‍රියා කරයි. කෙසේ වෙතත්, දිනපතා විවිධ ජාතීන්ට අයත්, විවිධ අදහස් ඇති දහස් සංඛ්‍යාත පිරිසක් ගැවසෙන මෙම ඓතිහාසික පරිශ්‍රයේ සුන්දරත්වය සහ ආරක්ෂාව ඒ අයුරින්ම පවත්වාගෙන යාම වර්තමානය වන විට දැඩි අභියෝගාත්මක කටයුත්තක් වී තිබේ.

### වත්මන් ගැටලු සහ අභියෝග

ගාලු උරුමට පදනම විසින් නිරන්තරයෙන් කොටු පවුර අවට පිරිසිදු කිරීමේ ශමදාන වැඩසටහන් ආදිය ක්‍රියාත්මක කළද, පැමිණෙන ඇතැම් පිරිස් නොහික්මුණු ලෙස තැන තැන කසළ බැහැර කිරීම නිසා පරිසර සුන්දරත්වයට දැඩිව හානි පැමිණේ.

මීට අමතරව, රාත්‍රී කාලයේදී මෙම ඓතිහාසික පරිශ්‍රය තුළ විවිධ නීති විරෝධී ක්‍රියාවල නිරත වන පුද්ගලයින් ගැවසෙන බවටත්, ඔවුන්ගෙන් පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්ට විවිධ හිංසා පීඩා සහ කරදර සිදුවන බවටත් තොරතුරු වාර්තා වී ඇත.

### තාක්ෂණික විසඳුම: 'සෝලා CCTV' කැමරා පද්ධතිය

මෙම ගැටලුවලට ස්ථිරසාර සහ නූතන තාක්ෂණික විසඳුමක් ලබාදෙමින්, ගාලු උරුමය පදනමේ **2026 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට (Action Plan)** අනුව මුළු ගාලු කොටු පරිශ්‍රයම ආවරණය වන පරිදි නවීන **සෝලා CCTV (Solar CCTV) කැමරා පද්ධතියක්** සවිකිරීමට මේ වන විට තීරණය කර ඇත. සූර්ය බලශක්තියෙන් ක්‍රියාත්මක වන බැවින් මෙය පරිසර හිතකාමී මෙන්ම වඩාත් කාර්යක්ෂම ව්‍යාපෘතියක් වනු ඇත.

**ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු:**

- තැන තැන අවිධිමත් ලෙස කසළ බැහැර කරන පුද්ගලයින් හඳුනා ගැනීම.
- රාත්‍රී කාලයේ සිදුවන නීති විරෝධී ක්‍රියා මර්දනය කිරීම සහ වැරදිකරුවන් නීතිය හමුවට පැමිණවීම.
- සංචාරකයින්ට බියෙන් සැකෙන් තොරව ගැවසීමට හැකි උපරිම ආරක්ෂිත වටපිටාවක් නිර්මාණය කිරීම.

### ව්‍යාපෘතියේ වත්මන් ප්‍රගතිය

මෙම සුවිශේෂී ආරක්ෂක ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූලික ඇස්තමේන්තු (Estimates) සකස් කිරීමේ කටයුතු මේ දිනවල ඉතා සාර්ථකව සිදුකෙරෙමින් පවතී.රාජ්‍ය ප්‍රතිපාදනවලට පමණක් සීමා නොවී, මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මූල්‍ය අනුග්‍රහය **පෞද්ගලික අංශයේ ආයතනයක් (Private Sector)** හරහා ලබා ගැනීමට ද කටයුතු සූදානම් කරමින් පවතින අතර, ඒ සඳහා වන මූලික සාකච්ඡා මේ වන විටත් ඉතා සුබවාදී මට්ටමකින් පවත්වාගෙන යනු ලැබේ.

සියලු සාකච්ඡා සාර්ථක කරගනිමින් ඉතාමත් කඩිනමින් මෙම සෝලා CCTV කැමරා ව්‍යාපෘතිය නිම කිරීමට ගාලු උරුමය පදනම අපේක්ෂා කරයි. එමඟින් නීති විරෝධී ක්‍රියාවලින් තොර, පිරිසිදු, සුන්දර සහ ලොව ආරක්ෂිතම සංචාරක ගමනාන්තයක් ලෙස ලෝක උරුම ගාලු කොටුව අනාගත පරපුරට මෙන්ම ජාත්‍යන්තරයට දායාද කිරීමට හැකිවනු නොඅනුමානය.

# උරුමයේ ව්‍යාපාරික අවස්ථා...

ලෝක උරුම ගාලු කොටුව යනු ශ්‍රී ලංකාවට විදේශ විනිමය ගලා එන ප්‍රධානතම ආර්ථික තෝතැන්නකි. එහි පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්ගේ අවශ්‍යතා උසස් මට්ටමකින් සපුරාලීමත්, දේශීය ව්‍යවසායකයින් දිරිමත් කරමින් රටේ ආර්ථිකය නංවාලීමත් අරමුණු කරගෙන ගාලු කොටුවේ පල්ලිය වීදියේ පිහිටි **'ගෝල් හෙරිටේජ් එම්පෝරියම්' (Galle Heritage Emporium)** ගොඩනැගිලි පරිශ්‍රය ආශ්‍රිතව නව ආයෝජන අවස්ථා රැසක් විවෘත කර ඇත.ඒ අනුව, ගාලු උරුමය පදනම මැදිහත් වෙමින්, රාජ්‍ය ප්‍රසම්පාදන රීතිවලට අනුකූලව ඉතා විනිවිදභාවයකින් යුතුව මෙම ආයෝජකයින් තෝරාගැනීමේ කටයුතු මේ වන විට සිදුකරමින් පවතී.

**දේශීය ආයෝජනයට නව පණක්**

**'ගෝල් හෙරිටේජ් එම්පෝරියම්' වෙළඳ සංකීර්ණය විනිවිදභාවයෙන් යුතුව ආයෝජකයන්ට බදු දෙයි**

## සුළු කර්මාන්තකරුවන් වෙනුවෙන් වර්ග අඩි 180 ක නව පරිශ්‍රයක්

දේශීය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ සුළු කර්මාන්තකරුවන් දිරිගැන්වීම වෙනුවෙන් තවත් සුවිශේෂී අවස්ථාවක් වෙන් කිරීමට ගාලු උරුමය පදනම පියවර ගෙන ඇත. ඒ අනුව, Galle Heritage Emporium ගොඩනැගිල්ල පිටුපස පිහිටි **වර්ග අඩි 180 ක පමණ භූමි පරිශ්‍රය** සුදුසු ව්‍යාපාරික කටයුත්තක් සඳහා බදු පදනම මත ලබාදීමට ජාතික තරඟකාරී ලංසු ක්‍රමය යටතේ මිලගණන් කැඳවා ඇත.

## ආර්ථිකයට ලැබෙන දායකත්වය

ලෝක උරුම ගාලු කොටුවේ පවතින ඉහළ සංචාරක ආකර්ෂණය නිසා මෙම වෙළඳ කුටි හරහා මෙරට සාම්ප්‍රදායික නිපැයුම්, අත්කම් නිර්මාණ සහ දේශීය අනන්‍යතාවය විදහා දක්වන ව්‍යාපාරයන්ට ඉහළ ඉල්ලුමක් නිර්මාණය කරගත හැක. නිසි ප්‍රසම්පාදන ක්‍රමවේද ඔස්සේ මෙලෙස දේශීය ව්‍යවසායකයින්ට අවස්ථා ලබාදීම, රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමට මෙන්ම විදේශ විනිමය උපයා ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට ද මහඟු පිටුවහලක් වනු ඇත.

# යුධ කාමරයකින් උපන් 'සඳු ගැලරිය'.......

### 'ගිම්හතිත්ථ' සිට ලෝක උරුම ගාලු කොටුව දක්වා

පැරණි රුහුණු රාජධානියේ උතුරු කෙළවරේ පිහිටි ගාලු වරාය ඈත අතීතයේ හඳුන්වන ලද්දේ **'ගිම්හතිත්ථ'** යන නමිනි. එකල මෙම තොටුපොළ ග්‍රීක, රෝම, පර්සියානු, ඉතියෝපියානු, අරාබි, චීන හා ඉන්දියානු වැනි ලොව සතර දෙසින් පැමිණි වෙළෙන්දන්ගෙන් අතුරු සිඳුරු නැතිව පැවති කාර්යබහුල වෙළඳ නගරයක් (Port City) ලෙස සංවර්ධනය විය.



ගාල්ලේ ඉතිහාසය වඩාත් තීරණාත්මක ලෙස වෙනස් වන්නේ බටහිර යටත් විජිත පාලකයන්ගේ ආගමනයත් සමඟය.කෙසේ නමුත් කාලයාගේ ඇවෑමෙන් යටපත් වෙමින් පැවති මෙම අමිල ඉතිහාසය මතු පරපුර උදෙසා දෘශ්‍යමාන කිරීමට **ගාලු උරුමය පදනම** සුවිශේෂී පියවරක් තැබීය.



ඒ අනුව, **වර්ෂ 2012 දී** පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අවසරය හා පූර්ණ අධීක්ෂණය යටතේ, ගාලු කොටුවේ ඔරලෝසු කණුව අභිමුව පිහිටි පැරණි ලන්දේසි යුධ කාමරය (dungeon) විද්‍යාත්මකව සංරක්ෂණය කිරීම ආරම්භ කරන ලදී.

**ඓතිහාසික සන්ධිස්ථානයක්:** වසර කිහිපයක දැවැන්ත සංරක්ෂණ හා නිර්මාණ කාර්යයකින් පසු, ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට පැරණි යුධ කාමරයක් තුළ ඉතිහාසය නිරූපණය කෙරෙන කලාගාරයක් ජනතාව වෙනුවෙන් විවෘත කිරීමට ගාලු උරුමය පදනම සමත් විය. මෙය වර්තමානයේ **'සඳු ගැලරිය'** ලෙස කාගේත් ආදරයට හා ගෞරවයට පාත්‍ර වී ඇත.

# රුහුණුපුර ඉතිහාසයේ සිතුවම් පෙළගැස්ම......

‘සඳු ගැලරිය’ තුළ පැරණි සිතුවම් සහ මූර්ති ආශ්‍රයෙන් අතීතය ඉතා මනරම් ලෙස ප්‍රතිනිර්මාණය කර ඇත. මෙහි පැමිණෙන අයෙකුට:



- ගාල්ල ප්‍රදේශය හා බැඳුණු සුවිශේෂී ඓතිහාසික සිදුවීම්,
- යටත් විජිත පාලන සමයට පෙර හා පසු කාලීන දේශපාලන පසුබිම,
- රුහුණුපුර ඉතිහාසය සහ ගාල්ල අවට බැඳී පවතින සුන්දර ජනප්‍රවාද,



කලාවේ සහ ඉතිහාසයේ අපූර්ව සුසලිතයකින් යුතුව දැකබලා ගත හැක.



ඉතිහාසය හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට, පර්යේෂකයන්ට මෙන්ම මෙරට අතීත උරුමය අගය කරන ඕනෑම අයෙකු ජීවිතයේ එක් වරක් හෝ පා තැබිය යුතුම ස්ථානයක් ලෙස ගාලු උරුමය පදනම විසින් ප්‍රජාව වෙත දායාද කර ඇති මෙම **‘සඳු ගැලරිය’**, වර්තමානය වන විට දෙස් විදෙස් සංචාරකයන්ගේ සහ බුද්ධිමතුන්ගේ නොමඳ අවධානයට ලක්වන සුවිශේෂී සංස්කෘතික කේන්ද්‍රස්ථානයකි.

# ගාලු කොටුවේ හෙට දවස උදෙසා පෙළගැසුණු බහුවිධ ගවේෂණාත්මක සමීක්ෂණය....

**යුනෙස්කෝ ලෝක උරුමයක් වූ ගාලු කොටුවේ අනන්‍යතාවය සහ අනාගත උරුම කළමනාකරණය පිළිබඳව රුහුණ විශ්වවිද්‍යාලයේ සිසුන් කල කාලීන මැදිහත්වීම.**



ශ්‍රී ලාංකීය ඓතිහාසික උරුමයේ මෙන්ම සජීවී ලෝක උරුමයක අභිමානවත් සලකුණක් බඳු වූ ගාලු කොටුව, අතීත මුහුදු බඩ වෙළඳාමේ මෙන්ම විවිධ සංස්කෘතීන් මුසුවීමේ ජීවමාන සාක්ෂියකි. කෙසේ වෙතත්, වර්තමාන වාණිජකරණය සහ විවිධ අවභාවිතාවන් හේතුවෙන් මෙම අද්විතීය ලෝක උරුමයේ "කැපී පෙනෙන විශ්වීය වටිනාකම" (Outstanding Universal Value) මෙන්ම එහි පවතින අනන්‍යතාවය ද බරපතළ තර්ජනයකට ලක්වෙමින් පවතී.



මේ පිළිබඳව දැඩි අවධානයක් යොමු කරමින්, ගාලු කොටුවේ අනාගත උරුම කළමනාකරණය හා සංවර්ධනය අරමුණු කොට ගත්, ඉදිරි සැලසුම් සහගත ක්‍රියාමාර්ග ගැනීම උදෙසා සුවිශේෂී **බහුවිධ ගවේෂණාත්මක සමීක්ෂණයක්** පසුගියදා (2026 ජුනි 19 සහ 20 යන දෙදින පුරාවට) ගාලු කොටුව පරිශ්‍රයේදී සාර්ථකව පවත්වන ලදී.

## තරුණ දායකත්වය සහ බහුවිධ ප්‍රවේශය

රුහුණ විශ්වවිද්‍යාලයේ ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශයේ සිසු සිසුවියන් 20 දෙනෙකුගේ සක්‍රීය සහභාගීත්වයෙන් මෙම සමීක්ෂණය ක්‍රියාත්මක විය. මෙහි ඇති සුවිශේෂීත්වය වන්නේ මෙය හුදෙක් පුරාවිද්‍යාත්මක කෝණයකින් පමණක් නොව, ඉතිහාසය, සමාජ විද්‍යාව මෙන්ම භූගෝල විද්‍යාව වැනි විවිධ විෂය පථයන් ඔස්සේ ගාලු කොටුවේ වත්මන් තත්ත්වය විග්‍රහ කරගත් බහුවිධ (Multidisciplinary) ගවේෂණයක් වීමයි. වර්තමාන අවභාවිතාවන් නිසා උරුමයට සිදුවන හානිය මැනවින් අවබෝධ කරගනිමින්, එහි අනාගත පැවැත්ම තහවුරු කිරීම සඳහා ශාස්ත්‍රීය මට්ටමේ දත්ත රැස්කිරීමක් මෙහිදී සිදුවිය.

## උත්තුංග සත්කාර්යයකට ලැබුණු ශාස්ත්‍රීය සහයෝගය

මෙම ආදර්ශමත් ශාස්ත්‍රීය ව්‍යායාමය සාර්ථක කරගැනීම උදෙසා රුහුණ විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ පීඨාධිපති ප්‍රියන්ත රේණුක මහතා ප්‍රමුඛ ආචාර්ය මණ්ඩලය නොමසුරු දායකත්වයක් ලබා දුන්හ.

විශේෂයෙන්ම:



- **මහාචාර්ය හේමන්ත කුමාර මහතා** (සමාජ විද්‍යා අධ්‍යයනාංශය)
- **ආචාර්ය දර්ශන බණ්ඩාර මහතා** (අංශාධිපති - ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය)
- **කථිකාචාර්ය කවිඳු පබසර මහතා** (ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය)
- **ආචාර්ය මංජුල කරුණාරත්න මහතා** (භූගෝල විද්‍යා අධ්‍යයනාංශය)
- **ආචාර්ය නීල් විතානගේ මහතා** (භූගෝල විද්‍යා අධ්‍යයනාංශය)

ඇතුළු ගරු ඇදුරුවරුන්ගේ මඟපෙන්වීම සහ සිසුන්ගේ කැපවීම මෙම කටයුත්තේ කොඳු නාරටිය බඳු විය.

## රාජ්‍ය සහ ආගමික අනුග්‍රහයේ මනා සබැඳියාව

මෙම සමීක්ෂණයේ නිරත වූ කණ්ඩායම වෙනුවෙන් නේවාසික පහසුකම් සලසාලමින් ආගමික වශයෙන් උපකාර කළ අතිපූජ්‍ය පනංගල හේමාලෝක නායක හිමිපාණන් වහන්සේගේ ආශිර්වාදය මේ සඳහා නොඅඩුව ලැබුණි.

එමෙන්ම, මෙම සමස්ත ක්‍රියාවලිය පිටුපස සිටි ප්‍රධාන ගාමක බලවේගය වූයේ **ගාලු උරුමය පදනමයි.** එහි අධ්‍යක්ෂතුමා ඇතුළු සමස්ත නිලධාරී මණ්ඩලය ලබාදුන් නායකත්වය සහ සංවිධාන ශක්තිය, ශාස්ත්‍රීය පර්යේෂණයක් ප්‍රායෝගික තලයකට ඔසවා තැබීමට සමත් විය.



## අනාගතය උදෙසා බලාපොරොත්තුවක්

මෙම දෙදින සමීක්ෂණය මඟින් අනාවරණය කරගත් කරුණු සහ දත්ත, ඉදිරියේදී ගාලු කොටුව සුරැකීමේ සහ එහි සංවර්ධන සැලසුම් සකස් කිරීමේ ප්‍රතිපත්තිමය තීරණ සඳහා මහඟු පිටුවහලක් වනු ඇත. අපේ අතීත උරුමය වර්තමානයේ විනාශ වන්නට නොදී අනාගත පරපුරට දායාද කිරීම උදෙසා රුහුණ විශ්වවිද්‍යාලයීය සහෘදයන් තැබූ මෙම පියවර සැබැවින්ම සමස්ත ජාතියේම ඇගයීමට ලක්විය යුත්තකි.

# "ලෝක උරුමයක පියසටහන් මතින්: ගාලු කොටුවේ ජංගම වෙළඳාමට නව මුහුණුවරක්"

ලෝක උරුම නගරයක් වන ගාලු කොටුව තුළ සංචාරක කර්මාන්තය හා බැඳුණු ජංගම වෙළඳාම විධිමත් පරිදි නියාමනය කිරීමේ අරමුණින් ගාලු උරුමය පදනම විසින් ක්‍රියාත්මක කරන ලද විශේෂ වැඩසටහන මේ වන විට නව මානයකට එළඹ තිබේ. සංචාරකයන්ගේ පහසුව මෙන්ම ජංගම වෙළඳුන්ගේ වෘත්තීය ජීවිතයේ සුරක්ෂිතභාවය ද අරමුණු කරගනිමින් දියත් කළ මෙම වැඩපිළිවෙළ සැබැවින්ම ප්‍රශංසනීය පියවරකි.

## විධිමත් නියාමනයක ආරම්භය :

2023 වසරට පෙර සිටම ගාලු කොටුව පරිශ්‍රයේ ජංගම වෙළඳාමේ නියුතු වූවන් හඳුනාගනිමින් ඔවුන් වෙත නිල හැඳුනුම්පත් නිකුත් කිරීමේ වැඩසටහනක් පදනම විසින් ආරම්භ කරන ලදී. එහි අඛණ්ඩ පියවරක් ලෙස, 2023 වසරේ සිට මෙම වෙළඳුන්ගේ වෘත්තීය සුරක්ෂිතතාව තහවුරු කරමින්, ඔවුන් විනය ගරුක වෙළඳාමකට යොමු කිරීම සඳහා වූ කොන්දේසි මාලාවක් හඳුන්වා දෙන ලදී. මෙහි ඇති විශේෂත්වය වන්නේ, සංචාරකයන්ට වෙළඳුන් පහසුවෙන් හඳුනාගැනීමට හැකිවන පරිදි, අනුක්‍රමණික අංකයක් (Serial Number) සහිත හැඳුනුම්පතක් ඔවුන් වෙත පිරිනැමීමයි.

## 2026: නව හැඳුනුම්පත් ප්‍රදානය:



මෙම අඛණ්ඩ වැඩසටහනේ නවතම පියවර ලෙස, පසුගිය වසරවල ලියාපදිංචි වූ වෙළඳුන්ගේ හැඳුනුම්පත් යාවත්කාලීන කිරීමේ වැඩසටහන 2026 වසරේදී සාර්ථකව ක්‍රියාත්මක කෙරිණි. නියමිත කොන්දේසි මාලාවට අනුගතව විනය ගරුකව කටයුතු කළ තෝරාගත් වෙළඳුන් 32 දෙනෙකු වෙත, 2026 මැයි 08 දින පෙ.ව. 10.00 ට ගාලු උරුමය පදනමට අයත් තොරතුරු මධ්‍යස්ථානයේ Mini සම්මන්ත්‍රණ ශාලාවේදී නව හැඳුනුම්පත් ප්‍රදානය සිදුකරන ලදී.

මෙම අවස්ථාව සඳහා ගාලු උරුමය පදනමේ සභාපති මහාචාර්ය දේව මයිකල් ද සිල්වා මහතා, අධ්‍යක්ෂ අසංග උඩුල ධර්මදාස මහතා සහ පදනමේ නිලධාරීන් මෙන්ම හැඳුනුම්පත්ලාභී වෙළඳුන් ද සහභාගී වූහ.

## කොටු බැම්ම සුරැකීම සහ අනාගත දැක්ම :

මෙම වැඩසටහනේදී ගත් තවත් වැදගත් තීරණයක් වූයේ, කොටු බැම්ම මත සිදුවන සංචාරයන්ට බාධාවක් වන පරිදි සිදුකෙරුණු වෙළඳාම් ක්‍රියාවලිය විධිමත් කිරීමයි. ඒ අනුව, කොටු බැම්ම මත වෙළඳාම් කළ ජංගම වෙළඳුන් බැම්මට පහළ ප්‍රදේශයන් වෙත යොමු කිරීමට පියවර ගන්නා ලදී.

ගාලු උරුමය පදනම මෙහිදී තවත් ඉදිරි පියවරක් තබමින්, වෙළඳුන්ගේ වෘත්තීය ගෞරවය ඉහළ නැංවීමට ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සැලසුම් රැසක් ඉදිරිපත් කර ඇත:

- **නිල ඇඳුම් හා ගමන්මලු:** වෙළඳුන් වඩාත් පිළිවෙළකට හා ශිෂ්ඨ සම්පන්නව හඳුනාගත හැකි පරිදි විශේෂ නිල ඇඳුමක් සහ ගමන්මල්ලක් හඳුන්වා දීම.
- **නවීන ජංගම වෙළඳ රථ:** ගාලු කොටුවේ ඓතිහාසික පසුබිමට හා සුවිශේෂී උරුමයට හානි නොවන පරිදි නිර්මාණය කළ ජංගම වෙළඳ රථ ආකෘතියක් හඳුන්වා දීම.
- **වෘත්තීය දියුණුව:** ප්‍රවීණ සම්පත්දායකයන් යොදාගනිමින් ඔවුන්ගේ වෘත්තීය දක්ෂතා දියුණු කිරීමට සහ වර්ධනය කර ගැනීමට හැකි වන පුහුණු වැඩසටහන් සඳහා යොමුකරවීම.

මෙම වැඩපිළිවෙළ මගින් ගාලු කොටුවේ සංචාරක අත්දැකීම ඉහළ නැංවෙනවා සේම, ජංගම වෙළඳුන්ගේ ජීවන තත්ත්වය සහ වෘත්තීය ජීවිතය උසස් කෙරෙන නව සංස්කෘතියක් ගොඩනැගීම ගාලු උරුමය පදනමේ අපේක්ෂාවයි.



# ගාලු උරුමය

කලාපය: 02

# Galle Heritage



## ඉදිරි ව්‍යාපෘති

- උරුම අගයට ගැළපෙන ජංගම වෙළඳ රථ
- පානිය ජල අවශ්‍යතා සපුරමින් පිංතාලිය ජල ව්‍යාපෘතිය
- Digitalize වන ශාක නාමකරණය
- සංචාරක පහසුව වෙනුවෙන් වීදි නාමපුවරු

ලෝක උරුමයක අභිමානය සුරකින නිල පුවත් සංග්‍රහය

කලාපය: 2026 අප්‍රේල් - ජූනි | දෙවන කලාපය

GALLE HERITAGE FOUNDATION

ලිපිනය: ගාලු උරුමය පදනම,
අංක 12, රැම්පාට් වීදිය,
ගාලු කොටුව.

දුරකථන: 091-2246784
විද්‍යුත් ලිපිය: herifo@sltnet.lk

www.galleheritage.gov.lk